සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

## තෙවන වාර පරීක්ෂණය - 6 ශ්‍රේණිය - 2019
## Third Term Test - Grade 6 - 2019

නම : ............................................... භූගෝල විද්‍යාව කාලය : පැය 02 යි.

## I කොටස

සැළකිය යුතුයි :

- I කොටසේ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

---

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

01. ග්‍රාම නිලධාරි කොට්ඨාස කිපයක් එකතු වීමෙන් ........................................ සෑදී ඇත.
(පළාත, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය)

02. ශ්‍රී ලංකාවේ විශාලතම දිස්ත්‍රික්කය ........................................ දිස්ත්‍රික්කයයි.
(කොළඹ, අනුරාධපුරය, මහනුවර)

03. කාලගුණික මූලිකාංගයක් වන්නේ ........................................ යි.
(උෂ්ණත්වය, භූවිෂමතාව, වනාන්තර)

04. අවිධිමත් භූමි පරිහරණය නිසා ........................................ ඇතිවේ.
(වනවගාව, පාංශු ඛාදනය, පාංශු සංරක්ෂණය)

05. අම්ල වැසි ඇතිවීම නිසා ........................................ සිදුවේ.
(ජලය වාෂ්පවීම, ජලජ ජීවීන් බිහිවීම, පස නිසරුවීම)

- ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් 3 ලකුණ ද වැරදි නම් 6 ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

06. ශීතකරණය භාවිතා කිරීමේ දී දොර අරින වහන වාර ගණන වැඩිකිරීමෙන් විදුලිය ඉතිරි කර ගතහැකිය. (          )

07. මාලිමා යන්ත්‍රය නොමැතිව ද අපට දිශාව හඳුනා ගත හැකිය. (          )

08. ඉන්දියා උපමහද්වීපයේ සිට හමා එන වියළි සුළංවල බලපෑම නිසා ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ උෂ්ණත්වය අඩුවේ. (          )

09. ශ්‍රී ලංකාවේ විශාලතම පරිපාලන ඒකකය පළාතයි. (          )

10. යම් කිසි ස්ථානයක කෙටි කාලයක් තුළ වායුගෝලයේ පවතින ස්වභාවය කාලගුණයයි. (          )



LIVEWORKSHEETS

I 11 සිට 15 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර පහත පිළිතුරු අතරින් තෝරා නිවැරදි අක්ෂරය දී ඇති වරහන තුළ යොදන්න.

| | | |
|---|---|---|
| A වළාකුළු | B උත්ස්වේදනය | C ප්‍රභාසංස්ලේෂණය |
| D වර්ෂාපතනය | E මතුපිට ගලායාම | F මඳ සුළං |
| G සැඩ සුළං | H ජල වහනය | I වාෂ්පීකරණය |

11. ශාකවලින් ජලය වාෂ්ප වීම මේ නමින් හඳුන්වයි. ( )

12. සෙමෙන් හමන සුළඟකි. ( )

13. ජල වාෂ්ප ඝනීභවනය වීමෙන් මේවා සෑදේ. ( )

14. පොළොවේ ඇති ජලයට සූර්යාලෝකය වැටීමෙන් මෙය සිදුවේ. ( )

15. ප්‍රධාන කාලගුණික අංගයකි. ( )

I 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.

16. උෂ්ණත්වය හා තාපය ලබා දෙන්නේ ........................................................................ විසිනි.

17. සුළඟේ වේගය මනින ඒකකය වන්නේ ........................................................................ යි.

18. ගෘහ ආශ්‍රිතව කරනු ලබන කර්මාන්තයක් ලෙස වෙස්මුහුණු සෑදීම ........................................................................ ප්‍රදේශයේ දක්නට ලැබේ.

19. වායුව දූෂණය වීමේ ප්‍රතිඵල මිනිසාට පමණක් නොව සතුන්ට හා ........................................................................ වලට ද අහිතකර ලෙස බලපායි.

20. ශ්‍රී ලංකාව අයත් වන්නේ විශාලම මහාද්වීපය වූ ........................................................................ මහාද්වීපයටයි.



LIVEWORKSHEETS